## පළමුවන තේමාව - ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරීත්වය

7

## 1.7. සේවය ලැබීමට නොව සේවය කිරීමට ඉදිරිපත් වෙමු.

### උසස් කෙරුමට සොයුරු දිවි මඟ



උසස් කෙරුමට සොයුරු දිවි මග සමිඳු සිහිනය පල දරා
රැගෙන දිය පිරි බඳුන පිස්නය අවදියෙන් හිස් හද දරා
පහත් වී පා සෝදනා විට ගුරු දෙවිඳු වචනය දරා
දුටිමු මහිමයෙ ඔබ පොරොන්දුව කුරුසයේ සිහසුන අරා

සමිඳාණන්ගේ...මහිමාලංකාරේ.. මා කෙරෙහි බැබළේ!
සමිඳාණන්ගේ...මහිමාලංකාරේ..ඔබ කෙරෙහි බැබළේ!
සාදුකාරය දීදී පවසමු ආමෙන් ! ආමෙන් ! ආමෙන් ! ආලේලූයියා !

අසුන් ගෙන අනුභවය සඳහා එම්මවුස් ඒ නිවහනේ
රැගෙන ආසිරි පුදා කඩමින් රොටි බෙදද්දී සමිඳුනේ
දනන් ශ්‍රාවක ඇස් ඇරුණ ලෙස කඩා අප දිවි බෙදද්දී
සංඝයෙන් අප ඔබේ මහිමය දකිමු ජන ඇස් ඇරෙද්දී


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සමිඳාණන්ගේ මහිමාලංකාරේ.....

ගෙවමු අප දිවි ඔබ තුළ ම රැඳී හැසිර ඔබ තුළ පවතිමු
නගා ඔබ මහිමයෙන් අප දූය අපි ඔබේ දරුවන් වෙමු
අල්පේච්ඡිත දිවියෙ මහිමය දොරෙන් දොරකට පවසමු
සඟ දිවිය අප විජය ගමනින් දෙව් රජය රජ කරවමු

සමිඳාණන්ගේ...මහිමාලංකාරේ.. මා කෙරෙහි බැබළේ!
සමිඳාණන්ගේ...මහිමාලංකාරේ.. ඔබ කෙරෙහි බැබළේ !
සාදුකාරය දිදී පවසමු
ආමෙන් ! ආමෙන් ! ආමෙන් ! ආලේලූයියා
සමිඳාණන්ගේ...මහිමාලංකාරේ.. ඔබ කෙරෙහි බැබළේ !

(පුබුදු ගීතාංජලී අංක 268)

- **ඉහත ගීතිකාව පොදුවේ ගායනා කරන්න.**
- **පස් දෙනකුට නොවැඩි කණ්ඩායමක් තුළ පහත දැක්වෙන කරුණු සාකච්ඡා කරන්න.**

1. ගීතයේ දෙවන කොටසේ "දනන් ශ්‍රාවක ඇස් ඇරුණ ලෙස කඩා අප දිවි බෙදද්දී" යන වගන්තියට අනුව අප ජීවිත කඩා බෙදා දෙන්නේ කෙසේ ද?
2. සමිඳුන් තුළ හැසිරෙමින් පවතින්නට ඔබට කළ හැකි දෑ මොනවා ද?

- **සාකච්ඡාවේ අදහස් කණ්ඩායමේ එක් අයකු ලවා පන්තියට ඉදිරිපත් කරන්න.**

රජකමට පත්වීම රජකම නැතිවීම ලෝක ඉතිහාසය තුළ දැක ගත හැකි ය. රාජ්‍ය ගොඩනැඟීම හා බිඳ වැටීම ඉතිහාසය තුළ මනාව පිළිබිඹු වේ.

එහෙත් ක්‍රිස්තුන් වහන්සේගේ රජකම එලෙස නැතිවන රජකමක් වත් ඔවුන් වහන්සේගේ රාජ්‍ය බිඳ වැටෙන රාජ්‍යයක්වත් නොවේ.

ආරම්භය (**A** අල්ෆා) හා අවසානය ( **Ω** ඔමේගා) වන ක්‍රිස්තුන් වහන්සේගේ තරුණ රජකම සදහට ම පවතින බවත් ඔවුන් වහන්සේගේ රාජ්‍යය සදා පවතින බවත් නාතාන් දිවැසිවරයා දාවිත් රජතුමාට දුන් පහත දැක්වෙන පොරොන්දුවෙන් මනාව පැහැදිලි වේ.

"නුඹේ ආයු කාලය සම්පූර්ණ වී නුඹේ පියවරුන් සමග සැතපුණ කල්හි, මම නුඹෙන් පැවත එන නුඹේ ම දරුවකු නුඹට පසුව රජකමට නංවා ඔහුගේ රාජ්‍යයෙහි ඔහු ස්ථිර කරන්නෙමි. ඔහු ම මාගේ නාමයට මාලිගාවක් ගොඩ නඟන්නේ ය. ඔහුගේ රාජ්‍යයේ සිංහාසනය ද සදහට ම ස්ථිර කරන්නෙමි. . . . . . නුඹේ වංශය ද, රාජශ්‍රීය ද මා ඉදිරියේ සදහට ම ස්ථිර කරනු ලබන්නේ ය."

(2 සාමුවෙල් 7:1216)

මනුෂ්‍ය බලය, මනුෂ්‍ය හැකියාව කෙරෙහි විශ්වාස කරමින් රජකම් කිරීම නැති වන අතර ප්‍රේමයෙන් රජකම් කරන විට ඒ රජකම සදහට ම පවතී.

"මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ සේවය ලැබීමට නොව, සේවය කරන්නටත්, බොහෝ දෙනෙකුගේ මිදීම උදෙසා සිය දිවි පිදීමට ත් ය."

(මතෙව් 20:28)

"මා නුඹලා අතර ජීවත් වූයේ උපස්ථාන ලබන්නකු ලෙස නොව උපස්ථාන කරන්නකු වශයෙනි." යනුවෙන් පැවසූ කිතු සමිඳුන්ගේ සේවක ස්වරූපය කැපී පෙනුණු අවස්ථාවකි, පාද දෝවනය. මෙලෙස කිතුනු දිවියක් මුහුකුරා යන තරමට සැබෑ සේවක ස්වරූපයක් අප තුළ ඇතිවිය යුතු ය.

මීට අවුරුදු 2700 කට පමණ පෙර යෙසායා දිවැසිවරයා ක්‍රිස්තුන් වහන්සේ හා ඔවුන් වහන්සේගේ සේවක ස්වභාවය පිළිබඳ ව කරන ලද අනාවරණය සලකා බලමු.

"මා සහාය දෙන මාගේ සේවකයා මෙන්න. මට ප්‍රිය වූ මාගේ තෝරාගත් තැනැත්තා මෙන්න. මාගේ ආත්මානුභාවය මා එතුමාට ප්‍රදානය කර ඇත. සියලු ජාතීන්ට එතුමා යුක්තිය ගෙන දෙනු ඇත. එතුමා උස් හඬින් කථා කරන්නේ වත්, මොර ගසන්නේවත් නැත; වීථිවල ඇසෙන පරිදි හඬ නගන්නේ නැත; තැළුණු බට දණ්ඩක් කඩා දමන්නේ නැත; නිවීගෙන යන පහන් තිරයක් නිවා දමන්නේ නැත; සැබවින් ම යුක්තිය ඉටු කරන්නේ ය; එතුමා කළකිරෙන්නේවත් අධෛර්ය වන්නේවත් නැත; මිහි පිට යුක්තිය පිහිටුවන තුරු එතුමාගේ දහම් මඟ උදාවන තුරු දිවැසින් බලා සිටිනු ඇත."

"....සෙනඟ හා මා අතර ගිවිසුමක් වන පිණිසත්, සියලු ජාතීන් අතර ආලෝකයක් වන පිණිසත් මම නුඹ පත් කෙළෙමි. මා එසේ කළේ නුඹ අන්ධයන්ගේ ඇස් පහදන පිණිසත්, සිරගෙයි සිරකරුවන් ද දඟ ගෙයි අඳුරෙහි වසන්නන් ද මුදන පිණිසත් ය."

(යෙසායා 42:14, 67)

**ජොහන්ගේ පියා වූ සෙකරියස් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ ව දිවැස්වැකි පවසමින් මෙසේ කී ය.**

## සෙකරියස්ගේ ප්‍රශංසා ගීතය



"ඊශ්‍රායෙල් හි දෙවි සමිඳාණන්, සිය සෙනග වෙත බලා කරුණාවෙන්, විමුක්තිය සලසා දුන් බැවින්, එතුමන් හට තුති පැසසුම් වේ වා! සිය දාසයා වූ දාවිත්ගේ වංශයෙන් අප හට, බලවත් මිදුම්කාරයෙකු එතුමාණෝ එවූ සේක. එසේ වූයේ, පෙර ශුද්ධ දිවැසිවරුන්ගේ මුවින් පැවසූ ලෙස ය. රුපුන්ගෙන් හා අපට වෛර බැන්දවුන්ගෙන්, අප මුදාලන පිණිස, එතුමාණෝ එය කළ සේක. මෙසේ, අප පියවරුන්ට කළ දයාපොරොන්දුව ඉටු කර, සිය ශුද්ධ ගිවිසුම සිහි කළ සේක. එය, අප පිය ආබ්‍රහම්ට එතුමන් දිවූ දිවුරුම ය. මෙසේ කළේ, අප සතුරන්ගෙන් මිදීම ලබමින්, නො බියව එතුමන්ගේ සේවයේ යෙදෙමින්, එතුමන් අබිමුවෙහි බැතියෙන් හා දැහැමින්, දිවි ඇති තෙක් විසීමට ය. ළදරුව, ඔබ සමිඳුන්ට පෙරටුව යමින්, එතුමන් මඟ පිළියෙල කරන බැවින්, 'මෙහෙසුරු දිවැසිවර' යන නම ඔබට දෙනු ඇත. එතුමන්ගේ සෙනඟට පව් කමාවෙන් ලැබෙන ගැළවීම ඔබ ඔවුන්ට දන්වන්නෙහි ය. අප දෙවිඳාණෝ මෘදු ය, දයාවන්ත ය. අප කෙරෙහි අහසින් ළහිරු රැස් උදා කරවන සේක. අඳුරේ හා මරණ සෙවණේ සිටින්නවුන් කෙරෙහි, එලෙසින් එළිය උදා කරවමින් සෙත් මග යාමට අපට මග පෙන්වන සේක." (ලූක් 1:6879)


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

අපගේ දේව මෑණියෝ ක්‍රිස්තුන් වහන්සේ තුළ සම්පූර්ණ වන දේව රාජ්‍යය පිළිබඳ ව මෙලෙස ගායනා කරති.

## මරියතුමියගේ ප්‍රශංසා ගීය



"එතුමන්ගේ දයාව සිය බැතිමතුන් කෙරේ, පරපුරෙන් පරපුරට පැතිරේ. සිය බාහුවෙන් එතුමාණෝ වික්‍රම් පා උඩඟු උදම් සිතැත්තන් විසුරුවා හැර, මහා නරපතීන් සිය සිහසුන්වලින් පහත හෙළා, දීනයන් ඉහළ නංවා උසස් කළ සේක. සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා, ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. අප පියවරුන් වූ ආබ්‍රහම්ට හා එම පරපුරට, සදහට ම පොරොන්දු වූ ලෙසට සිය සේවක ඊශ්‍රායෙල් සෙනඟ හට දයාව පෙන්වා පිහිට වූ සේක."

(ලූක් 1:5055)

**නාසරෙත්හි ජේසුස් වහන්සේගේ දේශනාවල කේන්ද්‍රය වූයේ දේව රාජ්‍යය යි. විශ්වාසය, බලාපොරොත්තුව හා දේව ප්‍රේමය මෙම රාජ්‍යයේ පදනම් වේ. දේව රාජ්‍යයට ඇතුළු වන අය කවුරුන්ද යි කන්ද උඩ දේශනාවෙන් අනාවරණය කර ඇත.**



දෙවියන් වහන්සේගේ රාජ්‍යය ප්‍රේමයේ රාජ්‍යයකි.

අන් අයට සේවය කරන රාජ්‍යයකි. අන් අයට සමාව දෙන රාජ්‍යයකි. අන් අය පිළිගන්නා, අන් අයට ගරු කරන රාජ්‍යයකි.

ආත්මාර්ථයෙන් තොර අසමසම රාජ්‍යයකි.

"ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසාද දිළිඳුන් හට සුබ ආරංචිය දේශනා කරනු වස් ඔවුන් වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම ද, අන්ධයින්ට පෙනීම ද ලැබෙන බව දන්වන්නටත්, පීඩිතවූවන් මුදන්නටත්, ස්වාමින් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්නටත් මා එවා වදාළ සේක."

(ලූක් 4:1819)


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## අපෙන් ඉල්ලන්නේ කුමක් ද?

"සියල්ල පැමිණෙන්නේ දෙවියන් වහන්සේගෙන් ය. ඔවුන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන අප තමන් වහන්සේට සමඟි කරගෙන, සමඟි කිරීමේ සේවය අපට දුන් සේක."

(2 කොරින්ති 5:18)

- **මිනිසා දෙවියන් හා සමගි කිරීම.**
- **මිනිසා මිනිසා අතර සමගි කිරීම.**
- **මිනිසා සොබාදහම සමග සමඟි කිරීම.**

**මෙම ත්‍රිවිධ කාර්යය අපට පවරා ඇත.**
**එම වගකීම ප්‍රේමයෙන් යුතු ව භාරගෙන, ප්‍රේමයෙන් යුතු ව ඉටු කරමු.**

**කළ යුතු දෑ:**

- යෙසායා 42:17 දක්වා කොටසින් අනාවරණය කරන සේවකයකුගේ ලක්ෂණ ඔබේ අභ්‍යාස පොතේ සටහන් කරගන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

- **ලූක් 4:1819 ශුද්ධ ලියවිලි පාඨ අනුව ඔබ ක්‍රිස්තු ශ්‍රාවකයකු ලෙස ක්‍රියා කරන්නේ කෙසේ ද?**
- **පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨ කියවා මෙනෙහි කරන්න.**

මතෙව් 25:3146　　　　කොලොස්සි 1:1519

එළිදරව්ව 21:15

සැබවින්ම,
මනුෂ්‍යයාගේ අභිරහස එළිදරව් වන්නේ
මාංශගත වූ වාක්‍යයාණන්ගේ අභිරහස තුළ ය.
ප්‍රථම මනුෂ්‍යයා වූ ආදම් මතු වඩින්නට සිටි
තැනැත් වහන්සේ වූ
ක්‍රිස්තුන් වහන්සේගේ පූර්වාදර්ශය විය.(රෝම 5:14)

අන්තිම ආදම් වූ ක්‍රිස්තුන් වහන්සේ, පියාණන් වහන්සේගේ හා
ඔවුන් වහන්සේගේ ප්‍රේමයේ අභිරහස ප්‍රකාශ කිරීමෙන් මනුෂ්‍යයා
මනුෂ්‍යයාට ම ප්‍රකාශ කර ඔහුගේ අති ශ්‍රේෂ්ඨ කැඳවීම
අනාවරණය කරන සේක.

දේව ප්‍රකාශනය මගින් විශ්වාසිකයනට පෙන්වා දෙනු ලබන
මනුෂ්‍යයාගේ අභිරහස මෙය ය. මෙය මහත් අභිරහසකි.

එහෙයින් ක්‍රිස්තුන් වහන්සේ මගින් ද ක්‍රිස්තුන් වහන්සේ තුළ ද
දුකේ සහ මරණයේ ගැටලුව විසඳෙයි. ඔවුන් වහන්සේගේ සුබාරංචියෙන් තොර ව
මේ ගැටළු අපට අවබෝධ නොවෙයි. තමන් වහන්සේගේ මරණයෙන්, මරණය
විනාශ කරමින් ක්‍රිස්තුන් වහන්සේ නැගිට වදාළ සේක.

පුත්‍රයාණන් වහන්සේ තුළ
"අබ්බා පියාණෙනි" යි (රෝම 8:15 ගලාති 4:6, ජොහාන් 1:12, 3:12)
හඬ නගන්නට අපට හැකිවන පිණිස ඔවුන් වහන්සේ අපට
ජීවනය නිර්ලෝභී ව දානය කළ සේක.

**වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නම්**
**විශ්ව ප්‍රකාශනයේ (අංක 22)**